(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 26.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2009 සැප්තැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0184/'09

1.

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තනය" නමින් ප්‍රතිපත්ති ප්‍රකාශනයක් නිකුත්කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) "මහින්ද චින්තනය" නමැති මුද්‍රිත ප්‍රකාශනය තුළ අන්තර්ගත යෝජනා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් මේවන විට ක්‍රියාත්මක කර තිබෙන යෝජනා සංඛ්‍යාව කොපමණද;

(iii) ඉතිරි යෝජනා ක්‍රියාත්මක කිරීමට කොපමණ කාලයක් ගතවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0279/'09

2.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2007 වර්ෂයේ දී ප්‍රධාන දුම්රිය පීලි පැනීම් 63ක් හා අනෙකුත් දුම්රිය පීලි පැනීම් 142 ක් වාර්තා වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එමගින් සිදු වී ඇති ශාරීරික හානි හා භෞතික අලාභයන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එවැනි තත්ත්වයක් ඇති වීමට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0292/'09

3.

ගරු රවි කරුණානායක මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මේ දක්වා වූ පසුගිය වසර දහයක කාලය තුළ එක් එක් වර්ෂයේදී;

(i) ශ්‍රී ලංකාව නැරඹීමට පැමිණි සමස්ත සංචාරකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ රටවල් සහ එම සංචාරකයින් මෙරට නැවතී සිටි සාමාන්‍ය කාලසීමාව කොපමණද;

(iii) උපයාගත් මුදල සහ සංචාරකයින් විසින් දරන ලද වියදමේ සාමාන්‍ය අගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වසර 10ක කාලය තුළ සෘජුව හෝ වක්‍රව සංචාරක කර්මාන්තයේ නිරතව සිටි ජනතාව කොපමණදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මේ දක්වා වූ පසුගිය වසර දහයක කාලය තුළ එක් එක් වර්ෂයේදී;

(i) මෙරට තිබූ හෝටල් කාමර සංඛ්‍යාව කොපමණද;

(ii) එම හෝටල් අයත්වන තරු පංතිය කවරේද;

යන්න එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0388/'09

4.

ගරු සාගල රත්නායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතියේ, නොරොච්චෝලේ ගල් අඟුරු ව්‍යාපෘතියේ සහ කෙරවලපිටිය බහු චක්‍රීය බලාගාරයේ මෙගා වොට් එකකට ප්‍රාග්ධන පිරිවැය (මිල දී ගැනීම් හා තැනීම් සඳහා වූ මූලධන වියදම) නවතම මිල ඉහළ නැගීම්ද සමග වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කැළණිතිස්ස පිහිටි ලං. වි. ම. ට අයත් බහු චක්‍රීය බලාගාරය;

(ii) ඒ්ඊඑස් (AES) ට අයත් බහු චක්‍රීය බලාගාරය;

(iii) කෙරවලපිටිය බහු චක්‍රීය බලාගාරය- බහු චක්‍රීය ක්‍රමයට සහ ඒක චක්‍රීය ක්‍රමයට;

(iv) යාපනයේ පිහිටි පෞද්ගලික අංශයට අයත් අයිපීපී (IPP) බලාගාරය සහ අනෙකුත් සියලුම අයිපීපී (IPP) බලාගාර;

(v) යාපනයේ පිහිටි තාවකාලික ඇග්‍රෙකෝ බලාගාරය;

(vi) ලං. වි. ම. ට අයත් හියවි වායු ටර්බයිනය;

යන එක් එක් බලාගාරයේ ඉන්ධන යෙදවුම සහ ව්‍යාපෘතියේ සම තීරුබදු වල ඇස්තමේන්තුගත ඒකක පිරිවැය එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කෙරවලපිටිය ව්‍යාපෘතිය සඳහා ඔවුන් විසින් ලබාගත් ණය සඳහා සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් සමාගම විසින් එකඟවන ලද පොලී පිරිවැය (අනුපාතිකය) එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0432/'09

5.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0505/'09

6\.
ගරු චන්දිම වීරක්කොඩි මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත අධ්‍යාපන සේවකයන්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිතියේ අධ්‍යක්‍ෂ මණ්ඩලය පිහිටුවූ දිනය කවදාද;

(ii) මෙම සමිතියේ සම්පූර්ණ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) වර්තමානයේ පවතින පුරප්පාඩු හා අතිරික්ත සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) මෑතකදී, සේවකයින් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළකර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේනම්, එම දැන්වීම් පළ කරන ලද පුවත්පත් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) නව අධ්‍යක්‍ෂ මණ්ඩලය පත්වීමෙන් පසුව බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් සහ තනතුරු කවරේද;

(iii) අදාළ සේවකයින් බඳවා ගැනීමේදී ආයතනය විසින් අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද,

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0379/'09

7\.
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 9 වැනි පිටුවේ (සිංහල මාධ්‍ය) යෝජනා කර ඇති පරිදි, පෙර පාසල් පාලිකාවන්ට අවශ්‍ය තාක්ෂණික පුහුණුව හා මූල්‍ය පහසුකම් මාසිකව සැපයීම මේ වන විට ක්‍රියාත්මක කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට එම පුහුණුව හා මූල්‍ය පහසුකම් ලබාදීම ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) ඒ අනුව, මෙම තාක්ෂණික පුහුණුව හා මූල්‍ය පහසුකම් ලබාදී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0242/'09

8\.
ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා නීති විද්‍යාලය පිහිටුවා තිබෙන්නේ කවර පනතක් යටතේද;

(ii) වර්ෂ 2000 සිට 2007 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ දේශන පවත්වන ලද්දේ කවර භාෂා මාධ්‍යයෙන්ද;

(iii) 2007 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ දේශන පවත්වනු ලබන්නේ කවර භාෂා මාධ්‍යයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2010 වර්ෂයේ සිට ශ්‍රී ලංකා නීති විද්‍යාලයට සිසුන් බඳවා ගනු ලබන වයස් සීමාව කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0280/'09

9.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුව මගින් පෞද්ගලික සමාගමක් වෙත තිරිංග මැදිරි තුනක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම සමාගමේ නම, ලිපිනය හා තිරිංග මැදිරි ලබාදුන් දිනය කවරේද;

(iii) ඒවා ලබා දී ඇති පදනම හෝ අදාළ ගිවිසුම කවරේද;

(iv) එම ගිවිසුම් වලට අනුව අදාළ දෙපාර්තමේන්තුවට මුදල් ගෙවා තිබේද;

(v) අදාළ මුදල් නොගෙවීම නිසා දෙපාර්තමේන්තුවට සිදු වී ඇති පාඩුවේ මූල්‍යමය වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0243/'09

10.

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2008 ජනවාරි මාසයේ සිට 2009 මාර්තු 31 දක්වා කාලය තුළ මරණයට පත් වූ ආරක්ෂක හමුදාවල සාමාජිකයන් කොපමණ සංඛ්‍යාවක් වෙනුවෙන් වන්දි මුදල් ගෙවා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කාලය තුළ මරණයට පත් වූ ආරක්ෂක හමුදාවල සාමාජිකයන් වෙනුවෙන් වන්දි මුදල් ගෙවා නොමැති සංඛ්‍යාව කොපමණද;

(ii) මරණයට පත්වන හමුදා සාමාජිකයෙකුට ගෙවන වන්දි මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) අදාළ වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීමට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3\.

ගරු විජිත හේරත් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

" පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2009 සැප්තැම්බර් මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*9.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*10.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*12.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*13.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*14.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*15.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*16.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

කැළෑ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*19.

පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*20.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 285 — වැඩසටහන 01,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් හැටඅට කෝටි පනස්තුන් ලක්ෂ අනූතුන් දහස් නවසිය තිස් අටක් (රු. 68,53,93,938) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 285 | — | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | 01 | — | මෙහෙයුම් වැඩසටහන |
| ව්‍යාපෘතිය | 01 | — | පරිපාලන හා ආයතන සේවා |
| | | පුනරාවර්තන වියදම් | රු. 68,53,93,938 |
| | | | රු. 68,53,93,958 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 අගෝස්තු මස 18 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 11 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 10 දක්වා එකතුව රු. 18,845,510,000.

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*26.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*27.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

28.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

29.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

30.

ග්‍රාස්රූට්ස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

31.

මහින්දානන්ද අලුත්ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

32.

අල්හාජ් එස්. එම්. එම්. හුසේන් පුණ්‍යාය භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

33.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

34.

ශ්‍රී ලංකා ජමාඅත් අන්සාරිස් සුන්නතිල් මොහමදියා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

35.

තාලියවක ශ්‍රී ආනන්ද බෝධි සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

36.

කරුණා සමාධි සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

37.

මහනුවර ශ්‍රී කල්‍යාණෝදය සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0433/'09

1.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතලේ මහ නගර සභා බල ප්‍රදේශයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0434/'09

2.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0435/'09

3\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0436/'09

4\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0437/'09

5\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0438/'09

6.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0439/'09

7.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?